



## මානෙල්:–

අප රටේ ජාතික පුෂ්පය වන නිල් මානෙල් මල ඉතා වැදගත් ස්ථානයක් ගනී. ප්‍රසන්න සුවඳකින් යුත් නිල් මහනෙල් මල ඕනෑම ජලාශ්‍රිත ප්‍රදේශයක ඉතා හොඳින් වැවේ. මෙම ශාකය වවා ගැනීම සඳහා විශාල ගැඹුරු ප්‍රදේශයක් අත්‍යාවශ්‍ය නොවන අතර, අඩියක් පමණ පළලින් සහ අඩියක් පමණ ගැඹුරින් යුතු බඳුනක වුවද මෙය හොඳින් වවා ගත හැක. මේවායේ බීජ හට නොගන්නා අතර, විශේෂිත ලක්ෂණය වන්නේ පත්‍රය මුලින් පැල හට ගැනීමයි. තවද මානෙල් ශාකයේ අල මගින් පැල බෝකර ගැනීමේ හැකියාව ද තිබේ.

## ඕලු :–

අප රටට ආවේනික වූ ඕලු මල් අතර සුදු සහ රෝස වර්ණයෙන් යුතු ඕලු මල් සුගන්ධයෙන් වැඩිය. උදෑසන කාලයේ පිපී සවස් කාලයේ පරව යන මෙම වර්ග දෙක සහ තවත් විශේෂයක් වන ඉතාමත් තද රතු වර්ණයෙන් යුක්තය. ඕලු "බෙරවා" ඕලු නමින් හඳුන්වයි. මෙහි විශේෂත්වය නම් රාත්‍රී කාලයේ පිපී පසුවදා උදෑසන 10 – 11 පමණ වන විට පර වී යාමයි. මේ සියළුම ඕලු මල් වලින් ඉතාම ප්‍රසන්න සුවඳක් විහිදේ.

අප රටට ආවේනික වූ මෙම ශාක වලට අමතරව විදේශ රටවලින් ආනයනය කරන ලද ඕලු, නෙලුම්, මානෙල්, වර්ග රාශියක් අද වෙළඳපලේ දක්නට හැකි අතර, මේවා අධික මිලකින් යුක්ත වේ. ඉතාම අලංකාර පත්‍රයන්ගෙන් සහ විවිධ වර්ණ වලින් යුක්ත මල් දක්නට ඇති අතර, මේ වර්ග වගා කිරීම සඳහා සාමාන්‍ය ගෙවත්තක හොඳින් හිරු එළිය සහ වාතාශ්‍රය ලැබෙන ස්ථානයක බඳුන්ගතව වවාගත හැක. මෙහි වගා මාධ්‍යය වශයෙන් කුඹුරු මඩ යොදා ගත හැකි අතර, බඳුන්ගත වගාවේදී සති 2 කට වරක්වත් ඊට අදාල පොහොර යෙදිය යුතු වේ.





මල් වගා සැලසුම් උපදේශක
**නිශාන්ත දිසානායක**

SRI LANKAN LIFE
**දෙවන වටය ඇරඹුනා**
ඔබටත් අයදුම් කළ හැකියි.....
ශ්‍රී ලංකන් ලයිෆ්, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
කොළඹ 07

Biz week MAGAZINE
ව්‍යාපාරික ලොවේ
ඉදිරි ගමනට අත්වැලක්
සතියේ දිනවල
සවස 01.00 සිට 03.00
දක්වා
සජීවී ලෙසින්